
සවියෙන් පෙරට - අපි එකට

e-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 10 | භූගෝල විද්‍යාව | 2 | 4. ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය |



සැකසුම:නෙලූපා නුවංගනී ගමගේ
බප/හො/තක්ෂිලා මහා විද්‍යාලය

# අරමුණු

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය , සත්ත්ව පාලනය හා ධීවර කර්මාන්තය පිළිබඳව කරුණු අධ්‍යනය කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණු වේ





# ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය

කෘෂිකර්මයට උචිත පාරිසරික තත්ත්ව යටතේ ගංගා නිම්න ආශ්‍රිතව කෘෂිකර්මාන්තය අතීතයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ආර්ථිකය හා බැඳී පවතී.






# ශ්‍රී ලංකාවේ වී වගාව

- ප්‍රධාන ආහාර බෝගය වීම
- අතීතයේ විජය කුමරු ඇතුළු පිරිස වී ගොවිතැන සඳහා යෝග්‍ය වූ ගංඟා නිම්න ආශ්‍රිතව ජනාවාස පිහිටුවා ගනු ලැබීය.
- යටත් විජිත යුගයේ වී වගාව පරිහානියට පත් වීම.
- නිදහසින් පසු වියළි කලාපයේ ගොවි ජනපද පිහිටුවීම, වැව් ප්‍රතිසංස්කරණය හරහා නැවත නඟා සිටුවීම.
- 1960 දශකයේ අවසානයේදී වී වගාව විශාල වශයෙන් දියුණු විය.

# වී වගාවේ වැදගත්කම

- ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වීම
- දේශීය වෙළඳ භෝගයක් ලෙස වැදගත් වීම
- සහල් ආශ්‍රිත අතුරු නිෂ්පාදන රාශියක් වෙළඳපොලට ඉදිරිපත් කිරීම, විවිධ ආහාර වර්ග, විවිධ සත්ත්ව නිෂ්පාදන යනාදිය
- කර්මාන්ත රැසකට අමුද්‍රව්‍ය සැපයීම
- ජෛන්ද්‍රීය පොහොර නිෂ්පාදනය
- වී වගාව ආශ්‍රිතව විවිධ රැකියා බිහි වීම

# වී වගාව ව්‍යාප්ත ප්‍රදේශ



# විවිධ පාරිසරික කලාපවලට වෙන් කර දැක්විය හැකිය

- වියළි කලාපය
- අතරමැදි කලාපය
- තෙත් කලාපය
- කඳුකර බිම්




# පාරිසරික කලාප

## 1. වියළි කලාපය

- අනුරාධපුරය, මඩකලපුව, හම්බන්තොට, පොළොන්නරුව, වව්නියාව, අම්පාර, යාපනය වැනි දිස්ත්‍රික්ක අයත් වේ.
- යල හා මහ කන්නය ද ඇතැම් ප්‍රදේශවල මැද කන්නය ද වී වගා කරනු ලැබේ.
- වැසි ජලය හා ජල සම්පාදනය මගින් වී වගාව සිදු කෙරෙන අතර වාරි ජලය මගින් ගොඩ වී වගාව ද සිදු කෙරේ.
- බිම් ඒකකයකින් ලබාගන්නා අස්වනු ප්‍රමාණය වැඩි බැවින් සහල් අතිරික්තයක් (excess ) නිපදවයි.
- යන්ත්‍රසූත්‍ර බහුල ව යොදා ගැනේ.

## 2. අතරමැදි කලාපය

- කුරුණෑගල දිස්ත්‍රික්කය ද බදුල්ල, මාතලේ, මොණරාගල, මාතර වැනි දිස්ත්‍රික්කවලින් කොටසක් ද මෙයට අයත් වේ.
- කුරුණෑගල, ශ්‍රී ලංකාවේ වැඩි ම බිම් ප්‍රමාණයක් වී වගා කරනු ලබන දිස්ත්‍රික්කය යි.
- වැසි ජලයෙන් හා ජල සම්පාදනයෙන් වගා කෙරේ.
- බිම් ඒකකයකින් ලබන අස්වනු ප්‍රමාණය වැඩි ය.
- යන්ත්‍රසූත්‍ර භාවිතය බහුල වේ.




4.2 සිතියම

ශ්‍රී ලංකාවේ වී වගා කරනු ලබන ප්‍රධාන කලාප

මූලාශ්‍රය **Biodiversity Conservation in sri lanka (1998)** ඇසුරින් සකස් කරන ලදි.

## 3. තෙත් කලාපය

- ගාල්ල, කළුතර, රත්නපුරය, කොළඹ, ගම්පහ, කෑගල්ල දිස්ත්‍රික්ක අයත් වේ.
- ගංගා මිටියාවත් හා පහත් ප්‍රදේශවල වී වගා කෙරේ.
- ප්‍රධාන වශයෙන් වර්ෂා ජලයෙන් වගා කරනු ලැබේ.
- අස්වනු ප්‍රමාණය වියළි කලාපයට සාපේක්ෂ ව අඩු ය.
- කුඩා බිම් කට්ටිවල (small plots) වගා කෙරේ.
- ජල ගැලීම්වලට භාජනය වීමෙන් බොහෝ විට වගා හානි සිදු වේ.

## 4. කඳුකර බිම

- මහනුවර, මාතලේ, නුවරඑළිය වැනි ප්‍රදේශ වැදගත් වේ.
- හෙල්මළු ක්‍රමයට වී වගා කෙරේ.
- ශ්‍රී ලංකාවේ අඩු ම බිම් ප්‍රමාණයක් වී වගාවට යොදා ගනු ලබන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ය.
- බිම් ඒකකයකට ලබන අස්වනු ප්‍රමාණය අඩු ය.

# ඉහත සඳහන් කලාපවල වී වගාව ව්‍යාප්ත වීමට හේතු

- **1900 mm** වැඩි වර්ෂාපතනය
- **21 °C – 35 °C** දක්වා උෂ්ණත්වය
- ජලය රඳා පවතින දියළු පස
- අස්වනු නෙලන කාලයේ වියළි කාළගුණය
- ජල සම්පාදනයට අවශ්‍ය පහසුකම් තිබීම
- මිනිස් ශ්‍රමය ලැබීම වැනි සාධක හේතු වී ඇත.

# ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වී ගොවිතැන

**සාම්ප්‍රදායික වී වර්ග**

- සුවඳැල්
- කළු හීනැටි
- මා වී
- පච්ච පෙරුමාල්
- කුරුළු තුඩ
- හැටදා වී
- රත් දෙල්
- මඩතවාලු

**සාම්ප්‍රදායික වී ගොවිතැනේ ජෛන්ද්‍රිය පොහොර භාවිතය සිදු විය.**

**උදා**

- ශාක පත්‍ර , පිදුරු , හරක් කටු

**රෝග කෘමීන් මර්දනය සඳහා කෙම් ක්‍රම භාවිතය**

**උදා**

- කොහොඹ තෙල්


# වී වගාව ආශ්‍රිත ගැටළු

- කුඹුරු ඉඩම් අයිතිය හා බුක්තිය නිරවුල් නොවීම නිසා නිසි පරිදි නඩත්තු නොකිරීම
- ගොවියාගේ අඩු ආදායම නිසා නවීන තාක්ෂනයට අනුගත නොවීම
- වගා බිම් අත්හැරීම
- වාරිමාර්ග හා ජලාපවහන ක්‍රම දුර්වල වීම
- නව බීජ ප්‍රචලිත නොවීම, ගුණාත්මක බීජ භාවිතය අඩු වීම, නිසි පරිදි පොහොර භාවිතා නොකිරීම වැනි තාක්ෂණිකමය ගැටළු ඇති වීම
- වගා ණය වැනි ගොවීන්ට පහසුකම් සපයන ආයතනවල පවතින ගැටළු
- ස්වභාවික විපත් - ජල ගැලීම් / නියඟ

# වී වගා කරන භූමි ප්‍රමාණය හා නිෂ්පාදන ප්‍රමාණය

| වර්ෂය | වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර් දහස් | නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් දහස් |
|---|---|---|
| 2008 | 1053 | 3875 |
| 2009 | 978 | 3652 |
| 2010 | 1065 | 4301 |
| 2011 | 1223 | 3894 |
| 2012 | 1067 | 3846 |

# වී වගා කරන භූමි ප්‍රමාණය හා නිෂ්පාදන ප්‍රමාණය 2008 - 2012




මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2013

# ශ්‍රී ලංකාවේ තේ වගාව

- ඉංග්‍රීසි ජාතික ජේම්ස් ටේලර් 1839 දී කඳුකර ප්‍රදේශයට හඳුන්වා දුනි.
- වතු වගාවක් ලෙස ආරම්භ වූයේ 1867 ලූල්කඳුර වතු යායෙනි.
- වර්තමානයේ කුඩා තේ වතු ලෙසද තේ වගාව ව්‍යාප්තව ඇත.



# වගා ප්‍රදේශ

- උඩරට තේ (Upcountry tea)

  - (1220mට වැඩි උස් බිම්වල) නුවරඑළිය

- මැදරට තේ (Midcountry tea)

  - (610m - 1220m දක්වා උස් බිම්වල)

  මහනුවර, මාතලේ, බදුල්ල

- පහතරට තේ (Lowcountry tea)


  - (610mට අඩු උස් බිම්වල) කළුතර,

  මාතර, ගාල්ල, හම්බන්තොට, කෑගල්ල

  රත්නපුරය, වැනි දිස්ත්‍රික්කවල

මූලාශ්‍රය - ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය

අතිරේක ගුරු අත්පොත (1997)



# තේ වගා ව්‍යාප්ති ප්‍රදේශ



# මෙම ප්‍රදේශවල තේ වගාව ව්‍යාප්ත වීමට බලපෑ සාධක


- **1900mm – 5400mm** දක්වා වූ වර්ෂාපතනය
- **15 °C – 27 °C** දක්වා සාමාන්‍ය උෂ්ණත්වය
- ලෝම ලැටරයිට් පස
- ජලය බැස යන මද බෑවුම් සහිත ප්‍රදේශ
- පුහුණු සේවක පිරිස
- දියුණු ප්‍රවාහන සේවය
- දේශීය හා විදේශීය වෙළඳපොල

# තේ නිෂ්පාදන ප්‍රමාණයේ වෙනස්කම් 2007-2012

ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන ප්‍රමාණය

(2007- 2012)

| තේ | නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන |
|---|---|
| 2007 | 305 |
| 2008 | 319 |
| 2009 | 291 |
| 2010 | 331 |
| 2011 | 328 |
| 2012 | 328 |



# තේ වගාව වැඩි දියුණු කිරීමට පවතින ආයතන

- තලවකැලේ තේ පර්යේෂණ ආයතනය
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය



# තේ නිපදවන විවිධ ආකාර



# ශ්‍රී ලංකා තේ මිලදී ගන්නා රටවල්

- ඉරාකය
- ඉරානය
- එක්සත් අරාබි එමීර් රාජ්‍යය
- සිරියාව
- ජෝර්දානය

මැද පෙරදිග කලාපයෙන් වැඩි ඉල්ලුමක් පවතී

- රුසියාව
- එක්සත් රාජධානිය
- ජපානය
- ඕස්ට්‍රේලියාව

# තේ වගාව දියුණු කිරීමෙන් ආර්ථික වාසි

- අපනයන ආදායම් ඉහළ යාම
- ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීම
- රැකියා උත්පාදනය
- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම
- දළ දේශීය නිෂ්පාදනය තුළ කෘෂි අංශයේ දායකත්වය ඉහළ යාම
- තේ කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් වර්ධනය වීම

# තේ වගාව ආශ්‍රිත ගැටළු

- ජාත්‍යන්තර වෙළඳපොලේදී කෙන්යාව, ඉන්දියාව වැනි සෙසු තේ නිෂ්පාදන රටවලින් ඇතිවන තරගය
- ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන පිරිවැය අධික වීම සහ නිරතුරුවම ඉහළ යාම
- තේ වගාවේ සහ නිෂ්පාදනයේ ඵලදායිතාව පහළ බැසීම
- අයහපත් කාළගුණික තත්වයන්ගෙන් සිදුවන හානි
- සිදුවෙමින් පවත්නා දේශගුණික විපර්යාස වලට අනුගත වීම
- විදේශීය රටවල විශේෂයෙන්ම මැද පෙරදිග පවත්නා සිවිල් අර්බුද සහ ඉරානය වැනි රටවල ආර්ථික සම්බාධක පැනවීම
- යුරෝපා කලාපයේ තේ පරිභෝජනය අඩු වෙමින් පැවතීම
- ශ්‍රී ලංකා තේ සාපේක්ෂව මිලෙන් අධික වීම
- තේ වතුවල පවත්නා දුර්වල කළමණාකරණය සහ ශ්‍රමිකයින්ගේ වැඩ වර්ජන

# තේ කර්මාන්තය දියුණු කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග

- වගා ඒකකයකින් ලැබෙන අස්වනු වර්ධනය කිරීමට වැඩි ඵලදායී වගා ක්‍රම හා පොහොර භාවිතය
- කුඩා තේ වතු හිමියන් දිරිමත් කිරීමට වතු සහනාධාර, පොහොර, බීජ ලබා දීම
- අස්වනු එකතු කිරීමට ජංගම රථ යෙදීම සහ ප්‍රමාණවත් මිලක් ලබා දීම.

# ශ්‍රී ලංකාවේ පොල් වගාව

- පොල් ගස් ශ්‍රී ලංකාවේ ජන ජීවිතය හා බැඳුණු සුවිශේෂී ශාකයකි.
- පොල් ගස කප්රුකකි.

ඒ කෙසේද යත් ආහාර හා පාන වර්ග විසිතුරු භාණ්ඩ සත්ව ආහාර වැනි විවිධ නිෂ්පාදන සැකසීමට පොල් ගසේ සෑම කොටසක්ම පාහේ ප්‍රයෝජනයට ගන්නා බැවිනි.

- විවිධ උත්සව අවස්ථාවල භාවිතය

  පොල් මල්

  ගොක් අතු

- 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ වගා බිම් වලින් හෙක්ටයාර තුන් ලක්ෂ අනූ පන්දාහක් පොල් වගාවට යොදවා ඇත.


- වගා බිම් ප්‍රමාණය හා පොල් ප්‍රමාණය අනුව 2012 වර්ෂයේ දී ලෝකයේ පොල් නිපදවන රටවල් අතර ශ්‍රී ලංකාවට 4 වන ස්ථානය හිමි වී තිබේ එම වර්ෂයේදී පොල් වගාවෙන් ලද ආදායම රුපියල් මිලියන 65551 කි.

- ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනයෙන් වැඩි කොටසක් දේශීය පරිභෝජනයට ගන්නා බැවින් ජන සංඛ්‍යාව වැඩි වීමත් සමඟ ගෘහස්ථ පරිභෝජනය ද වැඩිවෙමින් පවතී.

# පොල් ආශ්‍රිත විවිධ නිෂ්පාදන



# පොල් වගාව ව්‍යාප්ත ප්‍රදේශ



## පොල් ත්‍රිකෝණය

කොළඹ, කුරුණෑගල, පුත්තලම

## සුළු පොල් ත්‍රිකෝණය

රන්න, මිද්දෙනිය, තංගල්ල

- ශ්‍රී ලංකාවේ වගා බිම් ප්‍රමාණයෙන් සියයට 28ක් පමණ පොල් වගාවට යොදා ගෙන ඇත
- පොල්බිම් ප්‍රමාණය දෙවැනි වන්නේ වී වගාවට පමණි
- ලුණුවිල හා ඇඹිලිපිටිය පොල් පර්යේෂණායතනය මගින් පොල් වගාව ව්‍යාප්ත කිරීම ට කටයුතු කරයි.

# පොල් වගාව ව්‍යාප්තවීම කෙරෙහි බලපාන සාධක

- **2000mm – 2500mm** අතර වර්ෂාපතනය
- **20°C - 27 °C** සාමාන්‍ය උෂ්ණත්වය
- ලවණ මිශ්‍ර වැලි පස හා රැලි බිම
- ශ්‍රමය ලබා ගැනීමේ පහසුව
- දේශීය හා විදේශීය වෙළෙඳපොළ



# පොල් වගාව සම්බන්ධ ආයතන

**පොල් සංවර්ධන අධිකාරිය** - මෙම ආයතනය විසින් දේශීය වෙළඳාම, අපනයනය, පොල් සැකසීමේ සංවර්ධන වැඩසටහන් යනාදිය සිදු කරයි.

**පොල් වගා කිරීමේ මණ්ඩලය** - සහනාධාර බෙදා දීම, පැල තවාන් පිහිටුවීම සහ පැල බෙදා හැරීම මෙමගින් සිදු කෙරේ

**පොල් පර්යේෂණ ආයතනය** - මෙමගින් පොල් වගාව ආශ්‍රිත පර්යේෂණ සිදු කරයි. මෙය ලුණුවිල , බණ්ඩිරිප්පුව වත්තෙහි පිහිටා ඇත.

# පොල් වගාවේ දියුණුව සඳහා ගෙන ඇති පියවර

- පොල් වගාව සමඟ අතුරු බෝග වගාව සහ සත්ත්ව පාලනය මගින් පොල් ඉඩම්වල ඵලදායිතාවය සහ ආදායම ඉහළ නැංවීම.
- පොල් ඉඩම් කැබලි කොට විකිණීම වැළැක්වීම සඳහා නීතිමය පියවර ගෙන තිබීම.
- පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ ඇසුරින් ලද ප්‍රතිඵල වගා කරුවන් වෙත නොපමාව ලබා දීම සහ ඔවුන් ඒ පිළිබඳ උනන්දු කිරීම.
- පොහොර භාවිතයට උනන්දු කිරීම සහ පොහොර සහනාධාර දීම.
- බිංදු ජල සම්පාදනය , පාංශු සංරක්ෂණය සහ වැඩි ඵලදාවක් සහිත නව ශාක පැල කිරීම වැනි තාක්ෂණික ක්‍රම භාවිතය.
- පොල් වතු වගාවන්හි කළමනාකරණය විධිමත් කිරීම.
- පොල් නිෂ්පාදන ආයතන සීමා කිරීම.


# ශ්‍රී ලංකාවේ රබර් වගාව

**1890 දී පමණ බ්‍රිතාන්‍ය ජාතික හෙන්රි වික්හැම් විසින් ගම්පහ හෙනරත්ගොඩ උද්‍යානයේ මුල්ම රබර් පැලය රෝපණය කරන ලදී.**





# රබර් වගා කරන ප්‍රදේශ



# රබර් වගාවේ වැදගත්කම

- රැකියා සැපයීමේ මාර්ගයක් වීම
- අපනයන ආදායම් ඉපයීමේ මාර්ගයක් වීම
- පළමු හා දෙවන ලෝක යුධ සමයේ රබර් වලට ඇති ඉල්ලුම රබර් වගාවේ ව්‍යාප්තිය හා නිෂ්පාදනය වර්ධනය වීමට හේතු විය

# රබර් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක

## කෑගල්ල ,රත්නපුර ,කළුතර

**අනෙකුත් දිස්ත්‍රික්ක - කොළඹ ගම්පහ ගාල්ල**

**සුළු වශයෙන් රබර් වගා කරන දිස්ත්‍රික්ක**

**මාතලේ, මහනුවර, හම්බන්තොට, මොණරාගල**

**රබර් වගාව ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරන දිස්ත්‍රික්ක**

**මුලතිව්, වවුනියා**

# රබර් වගාවේ ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක

- **2000mm** වැඩි වර්ෂාපතනය
- **27°C** පමණ සාමාන්‍ය උෂ්ණත්වය
- කබොක් මිශ්‍ර රතු පස
- මධ්‍ය බෑවුම් සහිත **300m** ට වඩා අඩු ප්‍රදේශ
- පුහුණු ශ්‍රමය ප්‍රවාහන පහසුව ජාත්‍යන්තර වෙළඳපොළ හා දේශීය වෙළෙළඳපොළ

## අගලවත්තේ පිහිටි රබර් පර්යේෂණ ආයතනය

- රබර් වගාව ව්‍යාප්ත කිරීම
- වැඩි දියුණු කිරීම
- පර්යේෂණ සිදුකිරීම
- උපදෙස් ලබාදීම

## ශ්‍රී ලංකාවේ රබර් අපනයනය කරන රටවල්

ඔස්ට්‍රියාව
බෙල්ජියම
ප්‍රංශය
ජර්මනිය
ග්‍රීසිය
ඉතාලිය

යුරෝපා සංගමයේ රටවල්

ඉන්දියාව, චීනය,ජපානය, හොංකොං, පකිස්තානය හා ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවලට ද අපනයනය කෙරේ

# රබර් වගාවේ නිෂ්පාදන




# රබර් වගාවේ දියුණුවට ගත හැකි ක්‍රියාමාර්ග

- පැරණි වතු නැවත වගා කිරීම සඳහා සහනාධාර හා පොහොර සහනාධාර ලබා දීම
- සහතික මිලක් ලබා දීම
- කෘෂි ව්‍යාප්ති සේවා සැපයීම හා වගා උපදේශනය
- නව බිම් වගාවට යොදා ගැනීම හා රබර් බිම් කුඩා කැබලිකර විකිණීම සීමා කිරීම

# සුළු අපනයන භෝග

සාම්ප්‍රදායික අපනයන වලට අමතරව අපනයනය සඳහා කුඩා පරිමාණයේ වගා කරන කෘෂිකාර්මික භෝග සුළු අපනයන භෝග ලෙස හඳුන්වා දිය හැකිය



# ශ්‍රී ලංකා රජය විසින් 60 දශකයෙන් පසුව සුළු අපනයන භෝග කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට හේතු

- සාම්ප්‍රදායික අපනයනවල මිල උච්චාවචනය වීම
- තේ , පොල්, රබර් වැනි සාම්ප්‍රදායික අපනයන කෙරෙහි පමණක් බලාපොරොත්තු තැබිය නොහැකි වීම
- විදේශ විනිමය පිළිබඳ ගැටළු ඇති වීම
- ලෝක වෙළඳපොලේ සුළු අපනයන භෝගවලට ඉල්ලුම වැඩි වීම
- සුළු අපනයන භෝග වගා කිරීමෙන් දේශීය ජනතාවගේ ආදායම වැඩි කර ගත හැකි වීම
- තේ, රබර්, පොල් වගා කළ නොහැකි බිම්වල සුළු අපනයන භෝග වගාකළ හැකි වීම
- සුළු අපනයන භෝග අතුරු වගාවක් ලෙසද වගාකළ හැකි වීම
- රැකියා අවස්ථා බිහි වීම

# ආයතන

- **1972- සුළු අප අපනයන භෝග දෙපාර්තමේන්තුව**

- **සාම්ප්‍රදායිකව සුළු අපනයන බෝග වලට අමතරව අපනයන බෝග විවිධාංගීකරණ වැඩපිළිවෙළ (මල්, පලතුරු මිරිස් බුලත් රටකජු විසිතුරු පැල එළ එළවළු වැනි නව බෝග අපනයනය සඳහා එක්විය)**

- **2010 - කෘෂි අපනයන මණ්ඩලය මගින් ද මේ සඳහා විශාල දායකත්වයක් ලබා දීම**

- **මාතලේ පිහිටි සුළු අපනයන බෝගභෝග පර්යේෂණායතනය මගින් අවශ්‍ය උපදෙස් ලබාදීම සිදු කෙරේ**

| සුළු අපනයන භෝගය | ව්‍යාප්ති ප්‍රදේශ/ දිස්ත්‍රික්ක |
|---|---|
| කුරුඳු | මීගමුවේ සිට මාතර දක්වා වෙරළ තීරයේ තැනින් තැන ද රත්නපුර, හම්බන්තොට දිස්ත්‍රික්කවල ද වගා කෙරේ. |
| කෝපි | කළුතර, රත්නපුර, කෑගල්ල, ගම්පහ, මාතලේ, මහනුවර |
| ගම්මිරිස් | මහනුවර, මාතලේ, කෑගල්ල |
| කරදමුංගු | මහනුවර, කෑගල්ල, රත්නපුර, මාතලේ, මාතර |
| කරාබු නැටි | මාතලේ, මහනුවර, කෑගල්ල |
| සාදික්කා | මාතලේ, මහනුවර, රත්නපුර |
| කජු | මන්නාරම, හම්බන්තොට, පුත්තලම |
| පැඟිරි | මාතර, හම්බන්තොට |
| මල් වර්ග | නුවරඑළිය, බදුල්ල, බණ්ඩාරවෙල |

**මීට අමතරව ගර්කින්, පැණි කොමඩු, කෙසෙල් බඩ, ඉරිඟු, විසිතුරු පැල, මල් වර්ග මහවැලි සංවර්ධන කලාප වල මෙන්ම ගෙවතු වගාවක් ලෙස සෙසු ප්‍රදේශවල ද වගා කරනු ලැබේ**

| සාම්ප්‍රදායික සුළු අපනයන භෝග | සාම්ප්‍රදායික නොවන සුළු අපනයන භෝග |
|---|---|
| ගම්මිරිස් | මල් |
| කෝපි | පළතුරු |
| කොකෝවා | මිරිස් |
| සාදික්කා | බුලත් |
| කරාබු නැටි | රටකජු |
| කුරුඳු | විසිතුරු පැළ |
| | එළවළු |

# සුළු අපනයන භෝග වගා කිරීමේ ප්‍රයෝජන

- අතුරු භෝග වගාවක් ලෙස ගොවියාගේ ආදායම් මට්ටම ඉහළ නංවා ගත හැකි වීම
- රැකියා අවස්ථා වර්ධනය වීම
- විදේශීය විනිමය ඉපයිය හැකි වීම
- ප්‍රධාන වැවිලි භෝග තුනේ අපනයන මත රදා සිටීමේ අවදානම මගහැරී යාම


# ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරු

**ලංකාවේ කවර පළාතක වුවද එළවළු හා පළතුරු වගාව දැකගත හැක**



# එලවළු පලතුරු වගාකරන ආකාර

- කුඩා ඉඩම් කැබලිවල ව්‍යාපාරික මට්ටමින්
- අතුරු භෝග වගාවක් ලෙස
- ගෙවතු වගාවක් ලෙස



# එලවළු ව්‍යාප්ති ප්‍රදේශ

- වැලිමඩ,
- බණ්ඩාරවෙල,
- බදුල්ල,
- නුවරඑළිය

# එම ප්‍රදේශවල වගාවේ ලක්ෂණ,

- වර්ෂා ජලයෙන් මෙන්ම ජල සම්පාදනය යොදා ගැනීම
- මනා කළමනාකාරිත්වයක් පැවතීම
- ව්‍යාපාරික මට්ටමින් එළවළු වගා කෙරේ
- විශාල කම්කරුවන් පිරිසක් යොදවා ගැනීම.
- සත්ත්ව ගොවිපල වලින් ලබාගන්නා ඓන්ද්‍රීය පොහොර භාවිතය

බදුල්ල, මාතලේ, මහනුවර, හම්බන්තොට, අනුරාධපුරය, මොණරාගල, අම්පාර, යාපනය වැනි දිස්ත්‍රික්කවල ද දේශීය හා විදේශීය වෙළෙඳපොළ සඳහා විශාල වශයෙන් එළවළු වගා කෙරේ

# ශ්‍රී ලංකාවේ වගා කරන පලතුරු වර්ග



# පලතුරු

- ලංකාවේ විවිධ ප්‍රදේශවල සංවිධානාත්මකව වගා කෙරේ.
- ශ්‍රී ලංකාවේ පලතුරුවලට දේශීය මෙන්ම විදේශීය වෙළෙඳ පොළක් ද පවතී
- ව්‍යාපාරික මට්ටමින් වගා කරයි.
  (කෙසෙල්, අන්නාසි, අඹ, වැල්දොඩම්, මිදි, ගස්ලබු, දොඩම්, අලිපේර)
- කෙසෙල් - හම්බන්තොට, මොණරාගල, රත්නපුර
- පෙයාස්, මිදි ,ස්ට්‍රෝබෙරි - නුවරඑළිය, බදුල්ල, යාපනය
- පරිභෝජනය සඳහා දිවයිනේ සෑම ප්‍රදේශයකම වාගේ විවිධ පලතුරු වගා කරනු ලැබේ.
- නැවුම් පලතුරු ලෙස ද කැබලි හා පෙති ලෙස ඇසුරුම් කිරීමෙන් ද විජලනය කරන ලද පලතුරු ලෙස ද අපනයනය කෙරේ.

# එළවළු හා පළතුරු ආශ්‍රිත කර්මාන්ත නංවාලීමට ගතහැකි ක්‍රියාමාර්ග

- නිෂ්පාදන වර්ධනය සඳහා නව බිම් වගාවට යොදවා ගැනීම
- නිෂ්පාදනයේ ඵලදායිතාව වර්ධනය සඳහා නවීන තාක්ෂණය භාවිතය
- එළවළු හා පළතුරු සෞඛ්‍යාරක්ෂිතව නිෂ්පාදනය, ඇසුරුම් කිරීම , ගබඩා කිරීම හා ප්‍රවාහනය සඳහා අවශ්‍ය පියවර ගැනීම මගින් අපතේ යාම අඩු කර ගැනීම
- නව ආයෝජකයින් සඳහා රජය මගින් අවශ්‍ය පෙළඹවීම් ලබා දීම

    උදාහරණ - බදු සහන, ණය සහන

# සත්ත්ව පාලනය

**සත්ව පාලනය කෘෂිකර්මයට අයත් ය.**

**ශ්‍රී ලංකාවේ මෑත කාලයෙහි  සත්ව පාලනය කෙරෙහි විශේෂ අවධානයට හේතු-**

- ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම
- ග්‍රාමීය ප්‍රදේශවල ජන ජනතාවට රැකියා අවස්ථා ලබා දීම
- වගා කටයුතු සඳහා යොදාග ගත නොහැකි ආන්තික බිම් වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීම
- ගොවි ජනතාවට අතිරේක ආදායම් මාර්ගයක් සලසා දීම
- කෘෂිකර්මාන්තයට  අවශ්‍ය පොහොර ලබාදීම
- විදේශ විනිමය ඉපයීම හා  ඉතිරි කිරීම

## ප්‍රධාන වශයෙන් ගව පාලනය කරන දිස්ත්‍රික්ක

නුවරඑළිය
බදුල්ල
පොළොන්නරුව
හම්බන්තොට
අම්පාර
අනුරාධපුරය
කුරුණෑගල
මඩකලපුව

- මී ගවයන්ගේ 2/3 ඇති කරන්නේ වියළි කලාපීය ප්‍රදේශවලය

# කිරි ගව පර්යේෂණ මධ්‍යස්ථාන

- අඹේවෙල
- කනන්විල
- වල්පිට

**කාර්යයන්**


- ❑ නව දෙනුන් වර්ග හඳුන්වා දීම .
- ❑ තෘණ වර්ග හඳුන්වා දීම.
- ❑ අවශ්‍ය උපදෙස් ලබාදීම.

කිරි ගව සම්පත් මධ්‍යස්ථානය

(කිරි ගව සම්පත් හුවමාරු කර ගැනීම සඳහා )

මීවනපලාන

# කිරි පට්ටි ව්‍යාප්ත ප්‍රදේශ



# කිරි ආශ්‍රිත නිෂ්පාදන



# කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග

- පශු සම්පත් සංවර්ධනය සඳහා සත්ත්ව පාලන සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යංශයක් පිහිටුවීම
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයක් ඇති කිරීම
- ඒ මගින් ගොවිපල රාශියක් පවත්වා ගෙන යාම
- මහවැලි සංවර්ධන මණ්ඩලයේ ගොවිපල
- සත්ත්ව පාලනය සඳහා ආධාර හා අනුබල දීම

  උදාහරණ - දිවිනැගුම
- දේශීය පුද්ලික සමාගම් සඳහා සහන සැපයීම

  උදාහරණ - පැලවත්ත, ලකී ලංකා
- උසස් වර්ගයේ දෙනුන් අභිජනනය
- කිරි ගොවිපල ව්‍යාප්තිය සඳහා කටයුතු කිරීම

# කිරි පට්ටි පාලනය දියුණු කිරීමෙන් ලද හැකි ප්‍රයෝජන

- ✓ ශ්‍රී ලාංකීය ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතා ලබාදීම
- ✓ කිරි ආනයනය සඳහා යන විදේශ විනිමය ඉතිරි කර ගත හැකි වීම
- ✓ රැකියා අවස්ථා වර්ධනය වීම
- ✓ රටේ දළ දේශීය නිෂ්පාදනය වර්ධනය වීම

# ධීවර කර්මාන්තය








# ධීවර කර්මාන්තය සඳහා ලංකාවේ පවතින හිතකර සාධක

- ශ්‍රී ලංකාව සාගරයෙන් වට වූ දූපතක් වීම
- දිවයින වටා දිගු වේ වෙරළ තීරයක් පැවතීම
- පුළුල් මහද්වීපික තටකය
- බොක්ක, කලපු හා වරායන් පිහිටා තිබීම
- ගංගා, ඇළ - දොළ, වැව් හා ජලාශ පැවතීම
- මෝසම් කාල වල දියවැල් ක්‍රියාකාරීත්වය නිසා මත්ස්‍ය ආහාර බහුල වීම

# අනන්‍ය ආර්ථික කලාපය



# ධීවර කර්මාන්තය ව්‍යාප්ත ප්‍රදේශ



# ධීවර කර්මාන්තයේ වැදගත්කම

- ජනතාවගේ ආහාරය සඳහා අවශ්‍ය ප්‍රෝටීන් ලබා ගැනීම
- ධීවර නිෂ්පාදන සඳහා පුළුල් දේශීය හා විදේශීය වෙළෙඳ පොළක් පැවතීම
- රැකියා අවස්ථා උදාකර ගත හැකි වීම
- ධීවර නිෂ්පාදන අලෙවි කිරීමෙන් විදේශ විනිමය උපයා ගත හැකි වීම
- ධීවර කර්මාන්තය  දියුණු කිරීම් සඳහා අවශ්‍ය විභව සම්පත් පැවතීම

# ව්‍යාප්තව ඇති ප්‍රදේශ අනුව ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය බෙදී ඇති කොටස්

- කරදිය දී ධීවර කර්මාන්තය
- මිරිදිය ධීවර කර්මාන්තය
- කිවුල් දිය ධීවර කර්මාන්තය

# කරදිය ධීවර කර්මාන්තය

ශ්‍රී ලංකාවට අයත් අනන්‍ය ආර්ථික කලාපය තුළ කෙරෙන ධීවර කර්මාන්තය මෙයට අයත් වේ

ප්‍රධාන අංග දෙක-

1. වෙරළාසන්න හෙවත් මහද්වීපික තටකය තුළ ධීවර කර්මාන්තය
2. ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය

## වෙරළාසන්න ධීවර කර්මාන්තය

වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගන්නේ වෙරළාසන්න කලාපයේය.

- මන්නාරමේ සිට හම්බන්තොට දක්වා
- මඩකලපුවේ සිට යාපනය දක්වා වෙරළතීරය

## මසුන් බහුල වීමට හේතු

- මත්ස්‍ය ආහාර වන ප්ලැන්ක්ටන් බහුල වීම
- ගංගා ඇළ දොළ මගින් ගෙනෙන පෛන්ද්‍රිය පොහොර වෙරළබඩ කලාපයේ තැන්පත් වීම
- දිය වැල්වල ක්‍රියාකාරීත්වය නිසා මත්ස්‍ය ආහාර මතුපිටට පැමිණීම

# වෙරළාසන්න කලාපයේ සිටින මසුන්

- සාලයා
- හාල්මැස්සා
- හුරුල්ලා
- ඇටවල්ලා
- සූඩයා
- ගල්මාළු
- අලගුඩුවා

# ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය

රාජ්‍යය අනුග්‍රහය යටතේ පෞද්ගලික ව්‍යාපාරිකයන් විසින් විවිධ ආම්පන්න යොදා ගනිමින් ගැඹුරු මුහුදේ විශාල මසුන් අල්ලා ගැනීමයි.

මසුන් වර්ග

- තලපත්
- තෝරා
- මෝරා
- කොප්පරා
- කෙලවල්ලා
- බලයා

# ධීවර කර්මාන්තයේ භාවිත ආම්පන්න



# මිරිදිය ධීවර කර්මාන්තය

**ශ්‍රී ලංකාවේ රට අභ්‍යන්තරයේ ඇති ගංගා වැව් පොකුණු ඇළ දොළ ආශ්‍රිතව කෙරෙන ධීවර කර්මාන්තය මෙයට අයත් වේ**

මිරිදිය මසුන්

**ලූලා, කනයා, මඟුරා, කොරලියා, ගොඩයා, හුංගා, මස්පෙතියා, කාවයියා, තඩලයා**

වර්තමානයේදී වැව් හා ජලාශවල බෝකරන මසුන් -

**ග්‍රාස් කාප්, බිග්හෙඩ් කාප්, සිල්වර් කාප්, කැට්ලා, රොහු, තිලාපියා, ගුරාමි වැනි මසුන් බෝ කරනු ලැබේ**

මිරිදිය ධීවර කර්මාන්තයේදී සිදුකරන වෙනත්කටයුතු

- ජලජීවී වගාව
- විසිතුරු මසුන් බෝකිරිම
- මසුන් ආහාරයට ගන්නා පැළැටි වගා කිරීම

# මිරිදිය ධීවර කර්මාන්තයේ මත්ස්‍යයින්



# කිවුල්දිය ධීවර කර්මාන්තය

- **1760 Km** පමණ වූ ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ ස්ථාන රැසක මෙම ධීවර කටයුතු සිදු කෙරේ.
- යාපනය, පුත්තලම, මුන්දලම, හලාවත, මීගමුව, පොල්වත්ත ගඟ, මලල කලපුව, ආරුගම් බොක්ක වැනි ප්‍රදේශ කිවුල්දිය ධීවර කර්මාන්තය කෙරෙන ප්‍රධාන ප්‍රදේශ වේ.
- කලපු වැනි කරදිය හා මිරිදිය ආශ්‍රිත ප්‍රදේශ කිවුල්දිය ධීවර කර්මාන්තය සඳහා වඩාත් යෝග්‍ය වේ
- කඩොලාන ශාක පැවතිම, ගංගා ඇළ දොළවලින් ඓන්ද්‍රිය ද්‍රව්‍ය ගෙන ඒම වැනි හේතු මත වෙනස් වන ලවණතාවයට ඔරොත්තු දෙන මසුන් වර්ග බහුල වීම
- හලාවත, මීගමුව, පුත්තලම වැනි ප්‍රදේශවල ඉස්සන් හා කකුළුවන් ඇති කිරීම ව්‍යාපාරික මට්ටමින් සිදු කෙරේ
- දැනට බහු ජාතික සමාගම් මගින් ඉස්සන් බෝ කිරීම සඳහා ආධාර දෙනු ලැබේ

# කිවුල් දිය ධීවර කර්මාන්තයේ මත්සයයින්



# ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ගැටළු හා ප්‍රවණතා

- ✓ භූමි පරිභෝග ආශ්‍රිත ගැටළු
- ✓ නිෂ්පාදන ආශ්‍රිත ගැටළු
- ✓ වෙළදාම් ආශ්‍රිත ගැටළු
- ✓ පාරිසරික ගැටලු වශයෙන් බෙදා දැක්විය හැකිය

# භූමි පරිභෝජනය ආශ්‍රිත ගැටලු

- ඉඩම් හිඟය හා ඉඩම් කැබලි වීම.

  නිදසුන් - වී, තේ, පොල්, රබර් වගාවන් ආශ්‍රිතව

- කුඹුරු ඉඩම් ගොඩ කිරීම්.
- කෘෂිකාර්මික බිම් වෙනත් අවශ්‍යතා සඳහා යෙදවීම.
- රබර් ඉඩම් කට්ටි කිරීම.
- ජන සංඛ්‍යාව වැඩි වීමත් සමඟ නිවාස හා සංවර්ධන කටයුතුවලට ඉඩම් යෙදවීම්.
- එකම බිම්ක දීර්ඝ දීර්ඝකාලීනව වගා කටයුතු සිදු කිරීම නිසා අස්වැන්න අඩු වීම.

  නිදසුන් - වී, තේ , පොල්, රබර්

# නිෂ්පාදනය ආශ්‍රිත ගැටලු

- වතු පැරණි වීම නිසා අස්වැන්න අඩු වීම

  නිදසුන් - තේ, රබර්, පොල්
- ඉඩම් කැබලි වීම නිසා යන්ත්‍ර සූත්‍ර භාවිතය අඩු විම
- බිම් ඒකකයකින් ලබාගන්නා අස්වැන්න අඩුවීම

  නිදසුන් - වී, තේ, සුළු අපනයන බෝග
- වියළි කලාපීය ප්‍රදේශවල ජල හිඟය හා තෙත් කලාපීය ප්‍රදේශවල ජල අතිරික්තය

  නිදසුන් - වී
- අහිතකර උපකරණ භාවිතය නිසා හානිකර ක්‍රමවේද භාවිතය

  නිදසුන් - ධීවර කර්මාන්තය සඳහා
- නිෂ්පාදන වියදම අධික වීම නිසා ගොවීන්ගේ ණයගැති බව වැඩිවීම
- කර්මාන්තශාලා නවීකරණය නොවීම

  නිදසුන් - තේ , රබර්
- නව දෙනුන් හා සත්ව ආහාර වල මිල අධික වීම නඩත්තු වියදම අධික වීම

  නිදසුන් - කිරිපට්ටි පාලනය

- ප්‍රමාණවත් ගබඩා පහසුකම් ශීතාගාර පහසුකම් නොමැතිවීම වීම
  - නිදසුන් - වී, එළවළු, පලතුරු, මාළු, කිරි
- අවශ්‍ය ප්‍රවාහන පහසුකම් නොමැති වීම
  - නිදසුන් - ධීවර නිෂ්පාදන, කිරි, එළවළු, පලතුරු
- කම්කරු ගැටලු හා වෘත්තිය සමිති ගැටලු ඇතිවීම
  - නිදසුන් - තේ, පොල්, රබර්
- තාක්ෂණය පිළිබඳ නොදැනුවත් කම හා පුහුණුවක් නොමැති වීම
- යන්ත්‍ර සූත්‍ර මිල ඉහළ යාම
- ප්‍රමිතියකින් තොර බීජ භාවිතය නිසා වෙළෙඳ වෙළඳපොල ඉල්ලුමට සරිලන පරිදි නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම
  - නිදසුන් - එළවළු සහ පලතුරු
- වගා සහනාධාර වැඩපිළිවෙළ ක්‍රමවත් නොවීම
- ඉඩම් භුක්ති ගැටලු නිසා ලයිසන් ආධාර ලබා ගැනීමේ අපහසුව
  - නිදසුන් - සුළු අපනයන බෝග
- ධීවර යාත්‍රා, ධීවර ආම්පන්න, ශීතාගාර සහ ඉන්ධන සඳහා වන පිරිවැය ඉහළ යාම
  - නිදසුන් - ධීවර කර්මාන්තය

# වෙළඳාම සම්බන්ධ ගැටලු

- නිෂ්පාදන මිල දී ගැනීමේ මධ්‍යස්ථාන ප්‍රමාණවත් නොවීම
  
  නිදසුන් - වී, එළවළු, පලතුරු, කිරි,
- අතරමැදියන්ගේ ග්‍රහණයට හසුවීම නිසා ගොවියාගේ ආදායම අඩුවීම
  
  නිදසුන් - වී,එළවළු, පලතුරු, කිරි, මාළු
- ජාත්‍යන්තර වෙළෙඳ පොළේ මිල උච්චාවචනය වීම
- ආදේශන භාණ්ඩ වලින් එල්ලවන තරගය
  
  නිදසුන් - රබර් කෘතිම රබර්, තේ විවිධ පාන වර්ග
- වෙනත් රටවල් වලින් එල්ලවන තරගය
  
  නිදසුන් - තේ කෙන්යාව , රබර් මැලේසියාව
- දේශීය හා විදේශීය වෙළෙඳ පොළේ ස්ථාවර නොතිබීම

# පාරිසරික ගැටලු

- කෘමි හා වසංගත රෝග වලට ලක්වීම

  නිදසුන් - පොල් - කුරුම්ණී රෝගය, මයිටා ආක්‍රමණය

  එළවළු හා පලතුරු - පිටි මකුණා බෝ වීම

  ගව පට්ටි පාලනය - ගව කුර රෝගය

- ගංවතුර, නායයාම්, නියඟ, අධික වර්ෂාව, වර්ෂාපතනය මගින් වගා හානි සිදු වීම
- සුළං, දියවැල් හා සුනාමි තත්ත්ව මගින් ධීවර කර්මාන්තයේ ගැටලු මතුවීම
- පොහොර, කෘමි නාශක, වල් නාශක යොදා ගැනීමෙන් ජලය, ගොඩබිම, වායුව දූෂණය වීම නිසා සෞඛ්‍යමය ගැටලු ඇතිවීම
- පරිසර පද්ධතියේ පැවැත්මට අවශ්‍ය ශාක සහ සතුන් වඳ වීම
- අහිතකර ශාක හා සත්ත්ව කොටස් පරිසරයට එකතු වීම

# කෘෂිකර්මාන්තයේ ප්‍රවණතා

## නිෂ්පාදනය ආශ්‍රිත ප්‍රවණතා

- ❑ නිෂ්පාදනය වැඩිදියුණු දියුණු කිරීම සඳහා සහනාධාර ලබා දීම
- ❑ කෘෂිකාර්මික නිෂ්පාදන විවිධාංගීකරණය

  නිදසුන් - තේ - ක්ෂණික තේ, හරිත තේ, කෝඩියල්

  පොල් - විවිධ විසිතුරු නිෂ්පාදන

  සහල් පිටි - නූඩල්ස් , රසකැවිලි

- ❑ දේශීය පරිභෝජනය වැඩිවීම

  නිදසුන් - පොල්, එළවළු, පලතුරු, කිරි, මාළු

- ❑ කෘෂි බෝග ආශ්‍රිත අතුරු බෝග වගාව හඳුන්වාදීම

  නිදසුන් - පොල් වගා බිම් වල අන්නාසි, බුලත්, වැල් දොඩම්, ගම්මිරිස් වගා කිරීම්

- ❑ රබර් වගා බිම් වල කුරුඳු කෝපි ගම්මිරිස් වගා කිරීම්

- පර්යේෂණ ආයතන මඟින් නියඟ හා ජල ගැලීම් වලට ඔරොත්තු දෙන බීජ වර්ග හඳුන්වා දීම
- ජාන තාක්ෂණය හා ක්ලෝනකරනය මගින් වැඩි ඵලදාවක් ලබාදෙන බීජ වර්ග හඳුන්වා දීම

  නිදසුන් - මා වී වැනි වී වර්ග

  පොල් ආශ්‍රිත කප්සෙත, කප්සුවය
- නව වගා බිම් වගාවන් සඳහා යොදවා ගැනීම

  නිදසුන් - රබර් වගාව වව්නියාව මුල්තිව් දිස්ත්‍රික්කවල

  පොල් වගාව වියලළි කලාපීය ප්‍රදේශවල මහවැලි ප්‍රදේශවල
- ජෛන්ද්‍රීය පොහොර භාවිතය ප්‍රචලිත කිරීම

  නිදසුන් - කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගෝනවල මාකඳුර කාබනික පොහොර මධ්‍යස්ථානය පිහිටුවීම

# තාක්ෂණය ආශ්‍රිතව ප්‍රවණතා

- නවීන තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම
  
  නිදසුන් - වී වගාව සඳහා සංයුක්ත කොළ මඩින යන්ත්‍ර
  
  සුළං කරන යන්ත්‍ර, පැල සිටුවන යන්ත්‍ර
  
  ධීවර කර්මාන්තය - එකෝසවුන්ඩර්, සෝනාර් යන්ත්‍ර, චන්ද්‍රිකා සහ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය වැනි තාක්ෂණික ක්‍රම යොදා ගැනීම
- සත්ව ගොවිපළ යාන්ත්‍රීකරණය වැඩි කිරීම
- නවීන කිරි කැපීමේ ක්‍රම හඳුන්වාදීම
  
  නිදසුන් - රබර්

# වෙළඳාම ආශ්‍රිත ප්‍රවණතා

- පාරිභෝගිකයන්ගේ සිත් ඇදගන්නා අයුරින් ආකර්ෂණීය ලෙස කෘෂි නිෂ්පාදන සකස් කිරීම්
- නවීන ඇසුරුම් ක්‍රම භාවිතය
  - නිදසුන් - පැකට් කිරීම්, ටින් කිරීම, මලු සැකසීම
- පුද්ගලික සමාගම් ව්‍යාපාරික මට්ටමින් විවිධ නිෂ්පාදන සඳහා මැදිහත්වීම
  - නිදසුන් - මිල්කෝ , නෙස්ලේ , කොත්මලේ වැනි සමාගම්

# රාජ්‍ය අනුග්‍රහයය

- අපනයන තීරු බදු සහන ලබා දීම
- වෙළෙඳපොළ සේවා පුළුල් කිරීම
- පොහොර සහනාධාර සැපයීම

  නිදසුන් - වී, තේ, පොල්, රබර්, සුළු අපනයන බෝ

- විශ්‍රාම වැටුප් හා රක්ෂණ ක්‍රම හා හඳුන්වා දීම
- නැවත වගා කිරීම් සඳහා සහනාධාර ලබා දීම

  නිදසුන් - තේ, පොල්, රබර්, කුරුඳු

- ව්‍යාප්ති සේවා පුළුල් කිරීම
- කෘෂි බෝග ආශ්‍රිත ගෙවතු අලංකරනණ හා භූමි අලංකරණ වැඩසටහන් හඳුන්වා දීම

- පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම

  නිදසුන් - මාතලේ සුළු අපනයන බෝග සඳහා

  අඟුණුකොළපැලැස්ස මාංශ බෝග සඳහා

  ගන්නෝරුව බටඅත කෘෂි තාක්ෂණික උද්‍යාන

- අපනයන ගම්මාන ඇති කිරීම

  නිදසුන් - වී - පොලොන්නරුව හා කුරුණෑගල

  කජු -දඹදෙණිය

  මිරිස් - රාජාංගනය

  බුලත් - කටුගම්පොල

- කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා දිවිනැගුම හා ගැමිදිරිය වැනි වැඩ වැඩසටහන් හඳුන්වා දීම

**සවියෙන් පෙරට - අපි එකට**

**e-ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **10** | භූගෝල විද්‍යාව | **2** | **4. ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය - පිළිතුරු** |

**සැකසුම:නෙලූපා නුවංගනී ගමගේ**
**බප/හො/තක්ෂිලා මහා විද්‍යාලය**

<u>**ශ්‍රී ලංකාවේ වී වගාව**</u>

01. ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වීම
දේශීය වෙළඳ භෝගයක් ලෙස වැදගත් වීම
සහල් ආශ්‍රිත අතුරු නිෂ්පාදන රාශියක් වෙළඳපොලට ඉදිරිපත් කිරීම, විවිධ ආහාර වර්ග, විවිධ සත්ව නිෂ්පාදන යනාදිය
කර්මාන්ත රැසකට අමුද්‍රව්‍ය සැපයීම
ජෛන්ද්‍රීය පොහොර නිෂ්පාදනය
වී වගාව ආශ්‍රිතව විවිධ රැකියා බිහි වීම

02. බොඹුවල වී පර්යේෂණ ආයතනය
මහඉලුප්පල්ලම වී පර්යේෂණ ආයතනය
බතලේගොඩ වී පර්යේෂණ ආයතනය
හිඟුරක්ගොඩ වී පර්යේෂණ ආයතනය
අම්බලන්ගොඩ වී පර්යේෂණ ආයතනය

03. 1900mm වැඩි වර්ෂාපතනය
21 °C – 35 °C දක්වා උෂ්ණත්වය
ජලය රඳා පවතින දියළු පස
අස්වනු නෙලන කාලයේ වියළි කාළගුණය
ජල සම්පාදනයට අවශ්‍ය පහසුකම් තිබීම
මිනිස් ශ්‍රමය ලැබීම වැනි සාධක හේතු වී ඇත.

04. ගන්නෝරුව

05. කුඹුරු ඉඩම් අයිතිය හා බුක්තිය නිරවුල් නොවීම නිසා නිසි පරිදි නඩත්තු නොකිරීම
ගොවියාගේ අඩු ආදායම නිසා නවීන තාක්ෂනයට අනුගත නොවීම
වගා බිම් අත්හැරීම
වාරිමාර්ග හා ජලාපවහන ක්‍රම දූර්වල වීම
නව බීජ ප්‍රචලිත නොවීම, ගුණාත්මක බීජ භාවිතය අඩු වීම, නිසි පරිදි පොහොර භාවිතා නොකිරීම
වැනි තාක්ෂණිකමය ගැටළු ඇති වීම
වගා ණය වැනි ගොවීන්ට පහසුකම් සපයන ආයතනවල පවතින ගැටළු
ස්වභාවික විපත් - ජල ගැලීම් / නියඟ

06. කුඩා බිම්, යල මහ මැද කන්න, අතරමැදි කලාපයට, හෙල්මළු ක්‍රමයට, යන්ත්‍ර සූත්‍ර, වැඩිය, අඩුය, වාරි ජල සම්පාදනය, කුරුණෑගල

<u>ශ්‍රී ලංකාවේ තේ වගාව</u>

07. ජේම්ස් ටේලර් , 1939

08. 1867 , ලූල්කඳුර වතුයායේදී

09.

| ප්‍රදේශය | උස | දිස්ත්‍රික්ක |
|---|---|---|
| උඩරට තේ | 1220 m වැඩි උස්බිම් | නුවරඑළිය |
| මැදරට තේ | 610m - 1220m උස්බිම් | මහනුවර, මාතලේ, බදුල්ල |
| පහතරට තේ | 610m අඩු උස්බිම් | මාතර, ගාල්ල, හම්බන්තොට, කෑගල්ල, රත්නපුරය |

10. තලවකැලේ

11. 1900mm – 5400mm දක්වා වූ වර්ෂාපතනය
15 °C – 27 °C දක්වා සාමාන්‍ය උෂ්ණත්වය
ලෝම ලැටරයිට් පස
ජලය බැස යන මද බෑවුම් සහිත ප්‍රදේශ
පුහුණු සේවක පිරිස
දියුණු ප්‍රවාහන සේවය
දේශීය හා විදේශීය වෙළඳපොල

12. තලවකැලේ තේ පර්යේෂණ ආයතනය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

13. ක්ෂණික තේ, තේ කැට, කෝපි තේ, හරිත තේ, රන් තේ

14. ඉරාකය
ඉරානය
එක්සත් අරාබි එමීර් රාජ්‍යය
සිරියාව
ජෝර්දානය
රුසියාව
එක්සත් රාජධානිය
ජපානය
ඕස්ට්‍රේලියාව

15. අපනයන ආදායම් ඉහළ යාම
ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීම
රැකියා උත්පාදනය
ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම
දළ දේශීය නිෂ්පාදනය තුළ කෘෂි අංශයේ දායකත්වය ඉහළ යාම
තේ කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් වර්ධනය වීම

16. ජාත්‍යන්තර වෙළඳපොලේදී කෙන්යාව, ඉන්දියාව වැනි සෙසු තේ නිෂ්පාදන රටවලින් ඇතිවන තරගය
ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන පිරිවැය අධික වීම සහ නිරතුරුවම ඉහළ යාම
තේ වගාවේ සහ නිෂ්පාදනයේ ඵලදායිතාව පහළ බැසීම
අයහපත් කාලගුණික තත්වයන්ගෙන් සිදුවන හානි
සිදුවෙමින් පවත්නා දේශගුණික විපර්යාස වලට අනුගත වීම
විදේශීය රටවල විශේෂයෙන්ම මැද පෙරදිග පවත්නා සිවිල් අර්බුද සහ ඉරනය වැනි රටවල ආර්ථික සම්බාධක පැනවීම
යුරෝපා කලාපයේ තේ පරිභෝජනය අඩු වෙමින් පැවතීම
ශ්‍රී ලංකා තේ සාපේක්ෂව මිලෙන් අධික වීම
තේ වතුවල පවත්නා දුර්වල කළමණාකරණය සහ ශ්‍රමිකයින්ගේ වැඩ වර්ජන

17. වගා සහනාධාර සැපයීම
කුඩා තේ වතු වගාකරුවන් දිරිමත් කිරීම.
ණය පහසුකම් සැපයීම

## ශ්‍රී ලංකාවේ රබර් වගාව

18. 1890, ගම්පහ අස්ගිරිය හෙනරත්ගොඩ උද්‍යානයේදී, හෙන්රි වික්හැම්

19. කොළඹ, ගම්පහ, ගාල්ල

20. 2000mm වැඩි වර්ෂාපතනය
27°C පමණ සාමාන්‍ය උෂ්ණත්වය
කබොක් මිශ්‍ර රතු පස
මධ්‍ය බෑවුම් සහිත 300m ට වඩා අඩු ප්‍රදේශ
පුහුණු ශ්‍රමය ප්‍රවාහන පහසුව ජාත්‍යන්තර වෙළදපොළ හා දේශීය වෙළෙඳපොළ

21. අගලවත්ත

22. ඔස්ට්‍රියාව, බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය

23. රැකියා සැපයීමේ මාර්ගයක් වීම
අපනයන ආදායම් ඉපයීමේ මාර්ගයක් වීම
පළමු හා දෙවන ලෝක යුධ සමයේ රබර් වලට ඇති ඉල්ලුම රබර් වගාවේ ව්‍යාප්තිය හා නිෂ්පාදනය වර්ධනය වීමට හේතු විය

24. පැරණි වතු නැවත වගා කිරීම සඳහා සහනාධාර හා පොහොර සහනාධාර ලබා දීම
සහතික මිලක් ලබා දීම
කෘෂි ව්‍යාප්ති සේවා සැපයීම හා වගා උපදේශනය
නව බිම් වගාවට යොදා ගැනීම හා රබර් බිම් කුඩා කැබලිකර විකිණීම සීමා කිරීම

## ශ්‍රී ලංකාවේ පොල් වගාව

25. කොළඹ, කුරුණෑගල, හලාවත

26. රත්න, මිද්දෙනිය, තංගල්ල

27. මඩකලපුව, යාපනය

28. 28%

29. ලුණුවිල, ඇඹිලිපිටිය

30. 2000mm – 2500mm අතර වර්ෂාපතනය

20°C - 27 °C සාමාන්‍ය උෂ්ණත්වය

ලවණ මිශ්‍ර වැලි පස හා රැලි බිම

ශ්‍රමයලබා ගැනීමේ පහසුව

දේශීය හා විදේශීය වෙළෙඳපොළ

31. පොල් වගාව සමඟ අතුරු බෝග වගාව සහ සත්ත්ව පාලනය මගින් පොල් ඉඩම්වල ඵලදායිතාවය සහ ආදායම ඉහළ නැංවීම

පොල් ඉඩම් කැබලි කොට විකිණීම වැළැක්වීම සඳහා නීතිමය පියවර ගෙන තිබීම

පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ ඇසුරින් ලද ප්‍රතිඵල වගා කරුවන් වෙත නොපමාව ලබා දීම සහ ඔවුන් ඒ පිළිබඳ උනන්දු කිරීම

පොහොර භාවිතයට උනන්දු කිරීම සහ පොහොර සහනාධාර දීම

බිංදු ජල සම්පාදනය , පාංශු සංරක්ෂණය සහ වැඩි පලදාවක් සහිත නව ශාක පැල කිරීම වැනි තාක්ෂණික ක්‍රම භාවිතය

පොල් වතු වගාවන්හි කළමනාකරණය විධිමත් කිරීම

පොල් නිෂ්පාදන ආයතන සීමා කිරීම

<u>ලංකාවේ සුළු අපනයන භෝග වගාව</u>

32. සාම්ප්‍රදායික අපනයන වලට අමතරව අපනයනය සඳහා කුඩා පරිමාණයේ වගා කරන කෘෂිකාර්මික භෝග සුළු අපනයන භෝග ලෙස හඳුන්වා දිය හැකිය

33. ගම්මිරිස්, කෝපි, සාදික්කා, කරාබුනැටි, කුරුඳු, කොකෝවා

34. සාම්ප්‍රදායික අපනයනවල මිල උච්චාවචනය වීම

තේ , පොල්, රබර් වැනි සාම්ප්‍රදායික අපනයන කෙරෙහි පමණක් බලාපොරොත්තු තැබිය නොහැකි වීම

විදේශ විනිමය පිළිබඳ ගැටළු ඇති වීම

ලෝක වෙළඳපොලේ සුළු අපනයන භෝගවලට ඉල්ලුම වැඩි වීම

සුළු අපනයන භෝග වගා කිරීමෙන් දේශීය ජනතාවගේ ආදායම වැඩි කර ගත හැකි වීම

තේ, රබර්, පොල් වගා කළ නොහැකි බිම්වල සුළු අපනයන භෝග වගාකළ හැකි වීම

සුළු අපනයන භෝත අතුරු වගාවක් ලෙසද වගාකළ හැකි වීම

රැකියා අවස්ථා බිහි වීම

35. මාතලේ පිහිටි සුළු අපනයන බෝග පර්යේෂණායතනය

## ලංකාවේ ධීවර කර්මාන්තය

36. ශ්‍රී ලංකාව සාගරයෙන් වට වූ දූපතක් වීම
 දිවයින වටා දිගු වේ වෙරළ තීරයක් පැවතීම
 පුළුල් මහද්වීපික තටකය
 බොකු කලපු හා වරායන් පිහිටා තිබීම
 ගංගා ඇළ දොළ වැව් හා ජලාශ පැවතීම
 මෝසම් කාල වල දියවැල් ක්‍රියාකාරීත්වය නිසා මත්ස්‍ය ආහාර බහුල වීම

37. කරදිය දී ධීවර කර්මාන්තය
 මිරිදිය ධීවර කර්මාන්තය
 කිවුල් දිය ධීවර කර්මාන්තය

38. මන්නාරමේ සිට හම්බන්තොට දක්වා
 මඩකලපුවේ සිට යාපනය දක්වා වෙරළතීරය

39. සාලයා
 හාල්මැස්සා
 හුරුල්ලා
 ඇටවල්ලා
 සූඩයා
 ගල්මාළු
 අලගුඩුවා

40. මත්ස්‍ය ආහාර වන ප්ලැන්ක්ටන් බහුල වීම
 ගංගා ඇළ දොළ මගින් ගෙනෙන පෙන්ද්‍රිය පොහොර වෙරළබඩ කලාපයේ තැන්පත් වීම
 දිය වැල්වල ක්‍රියාකාරීත්වය නිසා මත්ස්‍ය ආහාර මතුපිටට පැමිණීම

## කෘෂිකර්මාන්තයේ ගැටළු සහ ප්‍රවණතා

41. භූමිපරිභෝග ආශ්‍රිත ගැටළලු
 නිෂ්පාදන ආශ්‍රිත ගැටලු
 වෙළඳාම් ආශ්‍රිත ගැටලු
 පාරිසරික ගැටලු

42. නිෂ්පාදනය වැඩිදියුණු දියුණු කිරීම සඳහා සහනාධාර ලබා දීම

කෘෂිකාර්මික නිෂ්පාදන විවිධාංගීකරණය

නිදසුන් - තේ - ක්ෂණික තේ, හරිත තේ, කෝඩියල්

පොල් - විවිධ විසිතුරු නිෂ්පාදන

සහල් පිටි - නූඩ්ල්ස් , රසකැවිලි

දේශීය පරිභෝජනය වැඩිවීම

නිදසුන් - පොල්, එළවළු, පලතුරු, කිරි, මාළු

කෘෂි බෝග ආශ්‍රිත අතුරු බෝග වගාව හඳුන්වාදීම

නිදසුන් - පොල් වගා බිම් වල අන්නාසි, බුලත්, වැල් දොඩම්, ගම්මිරිස් වගා කිරීම්

රබර් වගා බිම් වල කුරුඳු කෝපි ගම්මිරිස් වගා කිරීම්

43. අපනයන තීරු බදු සහන ලබා දීම

වෙළෙඳපොළ සේවා පුළුල් කිරීම

පොහොර සහනාධාර සැපයීම

නිදසුන් - වී, තේ, පොල්, රබර්, සුළු අපනයන බෝ

විශ්‍රාම වැටුප් හා රක්ෂණ ක්‍රම හා හඳුන්වා දීම

නැවත වගා කිරීම් සඳහා සහනාධාර ලබා දීම

නිදසුන් - තේ, පොල්, රබර්, කුරුඳු

ව්‍යාප්ති සේවා පුළුල් කිරීම

කෘෂි බෝග ආශ්‍රිත ගෙවතු අලංකරනණ හා භූමි අලංකරණ වැඩසටහන් හඳුන්වා දීම

**සවියෙන් පෙරට - අපි එකට**

**e-ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **10** | **භූගෝල විද්‍යාව** | **2** | **4. ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය - ඇගයීම** |

**සැකසුම:නෙලූපා නුවංගනී ගමගේ**

**බප/හො/තක්ෂිලා මහා විද්‍යාලය**

**ශ්‍රී ලංකාවේ වී වගාව**

01. ශ්‍රී ලංකාවේ වී වගාවේ වැදගත්කම් හතරක් නම් කරන්න.

02. වී පර්යේෂණ ආයතන පහක් නම් කරන්න.

03. ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා බලපා ඇති සාධක

| **භෞතික සාධක** | **මානුෂ සාධක** |
|---|---|
| | |
| | |
| | |
| | |

04. කෘෂි තාක්ෂණික උයන පිහිටියේ කොහේද?

05. වී වගාවේ මුහුණ දෙන ගැටළු තුනක් නම් කරන්න.

06. පහත දැක්වෙන ඡේදයෙහි හිස්තැන් පුරවන්න

වැඩිම වී වගා බිම් දැකිය හැක්කේ ............................................... දිස්ත්‍රික්කයේය. එය වී වගා කරන කලාප අතර ..................................... අයත් වේ. වියලි කලාපය හා අතරමැදි කලාපයේ .......................................... ලෙස කන්න තුනක් වගා කරනු ලැබේ.

බිම් ඒකකයක අස්වනු ප්‍රමාණය ............................................ ය. වියළි කලාපය හා අතරමැදි කලාපය තුල වැසි ජලයට අමතරව වී වගාව සඳහා .................................................... යොදා ගනී. ......................................................... භාවිතය වැඩිය.

ඉහත කලාප දෙකට සාපේක්ෂව තෙත් කලාපයේ හා කඳුකර බිම්වල වර්ග කිලෝමීටරයකට අස්වනු ප්‍රමාණය ................................... ය. තෙත් කලාපයේ ................................................ බිම් කට්ටිවල වගා කරන අතර කඳුකර බිම්වල ..................................... ක්‍රමයට වී වගා කරයි.

( කුඩා බිම්, යල - මහ -මැද කන්න, අතරමැදි කලාපයට, හෙල්මළු ක්‍රමයට, යන්ත්‍ර සූත්‍ර, වැඩිය, අඩුය, වාරි ජල සම්පාදනය, කුරුණෑගල)

**ලංකාවේ තේ වගාව**

07. ශ්‍රී ලංකාවේ තේ වගාව හඳුන්වා දෙනු ලැබුවේ ............................................... විසින් ............................ වර්ෂයේදීය.

08. තේ වගාව වතු වගාවක් ලෙස ව්‍යාප්ත වූයේ ............................................වර්ෂයේදී ............................... වතුයායේදීය.

09. ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ කොටස් තුනකි.පහත වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රදේශය | උස | දිස්ත්‍රික්ක |
|---|---|---|
| | | |

10. ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණායතනය පිහිටා ඇත්තේ කොහේද?

.....................................................................................................................................

11. ශ්‍රී ලංකාවේ තේ වගාව ව්‍යාප්තියට බලපෑ භෞතික හා මානුෂික සාධක පහත වගුවේ සඳහන් කරන්න.

| **භෞතික සාධක** | **මානුෂ සාධක** |
|---|---|
| | |

12. ශ්‍රී ලංකාවේ තේ වගාව වැඩි දියුණු කිරීමට බලපා ඇති ආයතන තුනක් නම් කරන්න.
13. ශ්‍රී ලංකාවේ අපනයනය සඳහා නිපදවනු ලබන විවිධ තේ වර්ග
14. ශ්‍රී ලංකාවේ තේ මිලදී ගන්නා ( අපනයනය කරන) ප්‍රධාන කලාපය හා ඊට අයත් රටවල් නම් කරන්න සහ සෙසු රටවල් නම් කරන්න
15. තේ වගාව දියුණු කිරීමෙන් ලංකාවේ ආර්ථිකයට ලබාගත හැකි ප්‍රයෝජන තුනක් නම් කරන්න.
16. තේ වගාව මුහුණ දෙන ගැටළු තුනක් නම් කරන්න.
17. ශ්‍රී ලංකාවේ තේ වගාව නංවාලීම සඳහා රජය ගත් පියවරයන් තුනක් නම් කරන්න.

<u>ශ්‍රී ලංකාවේ රබර් වගාව</u>

18. මුල්ම රබර් පැළය රෝපණය කරන ලද්දේ .......................................... වර්ෂයේදී .......................................... උද්‍යානයේදී බ්‍රිතාන්‍ය ජාතික ...................................................... විසිනි.
19. රබර් වගාව වැඩි වශයෙන් ව්‍යාප්ත දිස්ත්‍රික්ක තුනක් නම් කරන්න.
20. රබර් වගාව ව්‍යාප්තිය කෙරෙහි බලපාන භෞතික සහ මානුෂික සාධක පහත වගුවේ සඳහන් කරන්න

| **භෞතික සාධක** | **මානුෂ සාධක** |
|---|---|
| | |
| | |

21. ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණායතනය පිහිටියේ කොහේද?

22. ශ්‍රී ලංකාවේ රබර් අපනයනය කරන කරන ප්‍රධාන රටවල් මොනවාද?

23. රබර් වගාව දියුණුකිරීමෙන් ආර්ථිකයට ලබාගත හැකි ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න

24. රබර් වගාව නංවාලීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවරයන් තුනක් සඳහන් කරන්න

<u>ශ්‍රී ලංකාවේ පොල් වගාව</u>

25. ශ්‍රී ලංකාවේ පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයන් නම් කරන්න.

26. ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයන් නම් කරන්න.

27. පොල් ත්‍රිකෝණයෙන් බැහැර පොල් වගාකරන ප්‍රදේශ 2ක් ලියන්න.

28. ශ්‍රී ලංකාවේ මුළු බිම් ප්‍රමාණයෙන් පොල් වගාවට ....................% ක් යොදවා ඇත.

29. ශ්‍රී ලංකාවේ පිහිටි පොල් පර්යේෂණායතන දෙක නම් කරන්න

30. ශ්‍රී ලංකාවේ පොල් වගාව ව්‍යාප්තිය කෙරෙහි බලපාන භෞතික හා මානව සාධක සඳහන් කරන්න.

| භෞතික සාධක | මානුෂ සාධක |
|---|---|
| | |

31. පොල් වගාව දියුණු කිරීම සඳහා රජය ගෙන ඇති පියවරයන් තුනක් නම් කරන්න.

<u>ලංකාවේ සුළු අපනයන භෝග වගාව</u>

32. සුළු අපනයන භෝග යනු මොනවාද?

33. සුළු අපනයන භෝග සඳහා උදාහරණ 4ක් ලියන්න

34. ශ්‍රී ලංකා රජය විසින් 60 දශකයෙන් පසුව සුළු අපනයන භෝග කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට හේතුව වූ කරුණු 4ක් සඳහන් කරන්න.

35. සුළු අපනයන භෝග පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටියේ කොහේද ?

<u>ලංකාවේ ධීවර කර්මාන්තය</u>

36. ශ්‍රී ලංකාව සතුව පවතින ධීවර කර්මාන්තයට හිතකර සාධක 3ක් ලියන්න.

37. ව්‍යාප්තව ඇති ප්‍රදේශ අනුව ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකිය. ඒ මොනවාද?

38. ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ධීවර කර්මාන්තය බහුල ලෙස ව්‍යාප්තව වී ඇති  කලාප දෙක මොනවාද?

39. ඉහත කලාප තුළ බහුලව හමුවන කුඩා මසුන් වර්ග හතරක් නම් කරන්න.

40. ඉහත වෙරළාසන්න කලාපයේ කුඩා මසුන් බහුල වීමට හේතු වී ඇති සාධක දෙකක් ලියන්න

<u>**කෘෂිකර්මාන්තයේ ගැටළු සහ ප්‍රවණතා**</u>

41. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ නිෂ්පාදනය හා වෙළඳාම සම්බන්ධ ගැටළු දෙකක් බැගින් නම් කරන්න.

42. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිතව ප්‍රවණතා හතරක් ලියන්න.

43. දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග හතරක් නම් කරන්න.